www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 10 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I,II

නම/විභාග අංකය :- .......................................................... කාලය: පැය 03 යි.

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

❖ අංක 01 සිට 03 දක්වා ප්‍රශ්නවල එක් එක් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

(01) කාර්යාලයේ ඇති වූ තත්ත්වයක් සමඟ සමහරු **බොරදියේ මාළු බෑමට** සූදානම් වූහ.

(1) ඕනෑම අවස්ථාවක තම අභිමතාර්ථ සඵල කර ගැනීමට
(2) අවුල් සහගත අවස්ථා ඇති කිරීමට
(3) අවුල් සහගත අවස්ථාවල දී ප්‍රයෝජන ගැනීමට
(4) නොපෙනෙන මාළුන් වුවත් ඇල්ලීමට දක්ෂතා ඇති අය සිටින බව

(02) අපේ අතීත මුතුන් මිත්තන් මෙන් නොව වර්තමාන සමාජයේ බොහෝ **මිතිස්සු පිඹුරු දඩයමින්** ජීවත් වීමට අර අඳිති.

(1) කිසිදු සාරධර්මයක් නොහඳුන්නන් මෙන්
(2) මහන්සියක් නොමැතිව යමක් ලබා ගැනීමට
(3) අවංකබවින් තොරව ජීවත් වන අය ඇති බව
(4) පිඹුරු සම් ඉතා වටිනා දුර්ලභ දෙයක් වී ඇති නිසා

(03) නූතන සමාජය කෙතරම් උගත් වුවත් **බුලත් අතට ගම්මිරිස් කොළ තබන්නන්** ගැන නිතරම ජනමාධ්‍යයෙන් අපට ඇසේ.

(1) හරි වැරදි හොඳ නරක නොදන්නන් ගැන
(2) නරක දේ හොඳ ලෙස දකින අය
(3) සියලු දේ සමසිතින් විඳ ගැනීමට ප්‍රයත්න දරන අය
(4) බලවත් වංචා කිරීම් කරන්නන් ගැන

❖ අංක 04 සිට 06 තෙක් ප්‍රශ්නවලට හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

(04) සාහිත්‍යය නිර්මාණයක් පරිශීලනයෙන් පසිඳුරන් මගින් පාඨක මනසට පිවිස පාඨකයාගේ භාව ........................ හේතුවන වචන සංයෝජනය "සංකල්ප රූප" වේ.

(1) ප්‍රබෝධනයට (2) ප්‍රකාශනයට (3) සංකූලතාවයට (4) නිරීක්ෂණයට

(05) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ දී දක්ෂ ගුරුපරපුරක් ඇති කිරීමෙහිලා ................................ වූයේ සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර මැතිතුමා ය.

(1) මෙහෙය (2) පුරෝගාමී (3) අනුගාමී (4) පරාර්ථකාමී



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(06) මහාචාර්ය සේනක බිබිලේ මහතා විවිධ දුෂ්කරතා මධ්‍යයේ අධ්‍යාපනය ලබා එයින් ............................................ පල නෙළා ගත් විද්වතෙකි.

(1) පෘථුල (2) විමල (3) විපුල (4) ප්‍රබල

(07) අකාරාදී පිළිවෙළ නිවැරදිව දක්වෙන පද පේළිය තෝරන්න.

(1) පෞරුෂය, වශීකරණය, ඖෂධාලය, විභේදනය (2) අනවශේෂ, ඓතිහාසික, කෛරාටික, ජනමාධ්‍ය

(3) මහේෂ්වර, දෘශ්‍යමාන, ව්‍යුත්පත්තිය, පුරාවෘත්ත (4) පාණ්ඩිත්‍යය, ජ්‍යාමිතිය, අධිපති, ශාස්ත්‍රාලය

(08) සෑම පදයක අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) නශ්ඨාවශේෂ, ඖෂධ, පුස්තකාලය, ද්විභාෂා (2) ප්‍රහර්ෂය, දර්ශණය, බහුශ්‍රැත, තිරශ්චීන

(3) ධර්මිෂ්ට, කණ්ඨජ, උල්ලංඝණය, එලදායී (4) ශීඝ්‍රගාමී, ලේඛන, නීත්‍යනුකූල, ව්‍යංග්‍යාර්ථ

(09) අඝෝෂාක්ෂරයක්, විසර්ගය සහිත අක්ෂරයක් අන්තඃස්ථාක්ෂරයක් හා ඌෂ්මාක්ෂරයක් පිළිවෙළින් යෙදුණු වචනය සහිත වරණය තෝරන්න.

(1) රාජකීය, පාඨශාලාව, මනඃකල්පිත, පුරහල (2) ශක්තිමත්, සණ්ටාරය, කොමසාරිස්, යජුඃවේදය

(3) ඡායාරූපය, දුඃඛදායක, නිලඹර, චන්ද්‍රග්‍රහණය (4) අන්තඃපුරය, වර්ෂාව, ෆාමසි, බණිජ

(10) එක් එක් වචනවල මුල අකුරෙහි රකාරාංශය, ගයනුකිත්ත, ගැටපිල්ල හා දීර්ඝපාපිල්ල යෙදුණු වරණය තෝරන්න.

(1) විවෘත, ප්‍රංශය, ඌනතා, පුරාණෝක්ති (2) ප්‍රධාන, සෘෂිවරයා, පූරක, ඌව පළාත

(3) පූජනීය, ප්‍රාතිහාර්ය, සෘණ, පෞරාණික (4) ප්‍රාකාරය, ප්‍රෞඪ, කෘදන්ත, රූමත්

(11) මුලින් යෙදුණු අක්ෂර වර්ගයට අයත් අකුරෙන් නොයෙදුණු වරණය සහිත පිළිතුර තෝරන්න.

(1) ඌෂ්මාක්ෂර :- ශාක්‍යසිංහ, වොෆි, සාහිත්‍යය, වර්ෂාව

(2) ඕෂ්ඨජාක්ෂර :- පරතරය, මදුරාපුරය, සලබයා, ආරාමය

(3) සඤ්ඤක අක්ෂර :- කොළඹ, සුවඳ, ව්‍යර්ථ, හොඬවැළ

(4) මහාප්‍රාණාක්ෂර :- විභාගය, අනුරාධපුරය, ප්‍රතිඵල, ශාඛාව

(12) "අබ සැට ලාසක්, පුපුරන <u>ලෙසිනි</u>."

මෙම කවි පදයේ ඉරිඇඳි පදය,

(1) සමාසයකි. (2) නිපාතයකි.

(3) උපසර්ගයකි. (4) විභක්තියකි.

(13) "දෙව්නුවර උප්පලවර්ණ <u>දිව්‍යරාජයාට</u> ආයාචනය කිරීම මයුර සංදේශයේ අරමුණ විය." ඉරි ඇඳි පදය අයත් විභක්තිය වන්නේ,

(1) ප්‍රථමා විභක්තියයි. (2) සම්ප්‍රදාන විභක්තියයි.

(3) සම්බන්ධ විභක්තියයි. (4) කර්ම විභක්තියයි.

(14) "හෙන්රි ජයසේන, සී.ඩබ්.ඩබ්.කන්නන්ගර, මහගමසේකර, සේනක බිබිලේ යන බුද්ධිමතුන් ප්‍රසිද්ධ වී ඇති ක්ෂේත්‍ර පිළිවෙළින් යෙදී ඇති වරණය වන්නේ,

(1) දේශපාලනඥයෙක්, වෛද්‍යවරයෙක්, නාට්‍යවේදියෙක්, ගීතරචකයෙක්

(2) වෛද්‍යවරයෙක්, ගීතරචකයෙක්, දේශපාලනඥයෙක්, නාට්‍යවේදියෙක්

(3) නාට්‍යවේදියෙක්, දේශපාලනඥයෙක්, ගීතරචකයෙක්, වෛද්‍යවරයෙක්

(4) ගීතරචකයෙක්, වෛද්‍යවරයෙක්, නාට්‍යවේදියෙක්, දේශපාලනඥයෙක්



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

(15) "බැලුවෙහු" යනු

(1) මධ්‍යම පුරුෂ, ඒකවචන, අනතීත කාල, කර්තෘකාරක ක්‍රියා පදයකි.

(2) මධ්‍යම පුරුෂ, බහුවචන, අතීත කාල, කර්තෘකාරක ක්‍රියා පදයකි.

(3) ප්‍රථම පුරුෂ, බහුවචන, අතීත කාල, කර්මකාරක ක්‍රියා පදයකි.

(4) මධ්‍යම පුරුෂ, බහුවචන, අනතීත කාල, කර්මකාරක ක්‍රියා පදයකි.

(16) "නටවති" යන ක්‍රියාපදයේ උත්තම පුරුෂ ඒකවචන අනතීත කාල කර්තෘකාරක ක්‍රියාරූපය ඇතුළත් වරණය වන්නේ,

(1) නටවමි (2) නැටවෙමි (3) නැටවෙමු (4) නටවමු

(17) යුගල පදයක් නොවන පදයක් සහිත වරණය තෝරන්න.

(1) රැවුම් - ගෙරවුම්, වැර - වෑයම්, අන්න - පාන, ජර - මර

(2) අබල - දුබල, ඔල - මොළ , ඇද - පළුදු, ඉවර - පවර

(3) ඔප්පු - තිරප්පු, බලි - බිබිලි, ඇද - කුද, ඉඳුම් - හිටුම්

(4) දාන - මාන, පඩි - නඩි, කුඩු - කේඩු, ගම් - බිම්

(18) උපසර්ග පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) උප, පටන්, පරි, අති, බඳු

(2) වගේ, අප, පිළි, මෙන්, උප

(3) දුර්, අව, අභි, පර, සම්

(4) නෙක්, සු, මහා, ද, අනු

(19) විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) උදාගිර - නැගෙනහිර , කුලීන - කුලවත්

(2) ආධුනික - ප්‍රවීණ , චල - නිශ්චල

(3) කසළ - නිකසළ , පරිමිත - අපරිමිත

(4) අගාරික - අනගාරික , අධම - උත්තම

(20) ආණ, අණු, ආණි යන තද්ධිත ප්‍රත්‍යවලින් ප්‍රකාශ වන අර්ථය සහිත වරණය තෝරන්න.

(1) සමූහාර්ථය

(2) ගෞරවාර්ථය

(3) එයින් කරන ලද යන අර්ථය

(4) භාවාර්ථය

(21) නිවැරදි ලෙස යෙදී ඇති තනි පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) කළ නොකළ හරි වැරදි ගැන සිත සිතා කල්ගත කිරීම - කනස්සල්ල

(2) අනිකකුගේ ගෞරවයට හානි කිරීමේ ද්වේෂ සිතින් කරන බොරු ප්‍රචාර - දෙගිඩියාව

(3) යමක් කරම්දෝ නොකරම්දෝ යන අවිනිශ්චිත ගතිය - කුමන්ත්‍රණය

(4) අනෙකෙකුගෙන් තමාට සිදුවූ විපතක් ගැන වගකිව යුත්තෙකුට කියාපෑම - පැමිණිල්ල

(22) මුලින් දී ඇති ක්‍රියා වර්ගයට නොගැළපෙන ක්‍රියා පදය සහිත වරණය තෝරන්න.

(1) ප්‍රයෝජ්‍ය ක්‍රියා :- බලවයි, හඬවයි, නටවයි, ගයවයි.

(2) මිශ්‍ර ක්‍රියා :- කර කර, නටමින්, බල බලා, හඬමින්

(3) අසම්භාව්‍ය ක්‍රියා :- කළොත්, වැස්සොත්, බලමින්, කැඩුවොත්

(4) විධි ක්‍රියා :- හඬන්න, බලව්, දුවනු, වර

(23) මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් නොවන පද පේළිය සහිත වරණය තෝරන්න.

(1) වෘක්ෂ :- රුක්, තුරු, ගස, ධ්‍රැම

(2) අග්නි :- ගින්දර, අනල, රළු, දල

(3) ඇතා :- හස්ති, වරණ, නා, ගජ

(4) අහස :- සුරමග, නුබ, පවන්මඟ, ගගන



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

www.agaram.lk

(24) විරාම ලක්ෂණ නිවැරදිව යෙදුණු උද්ධෘතය තෝරන්න.

(1) "යාළුවා මාත් තල්ලු කරන්න උදව් වෙන්න ද?"

(2) "අර ඉන්නේ එයා නේද! අර දියට මොනවාදෝ විසිකරනවා"

(3) "මට මුකුත් පේන්නේ නෑ! මට දිපල්ලා රෙදි කෑල්ලක්!

(4) මුහුද අභ්‍යන්තරයෙහි ඇතැයි සැලකෙන ජල ඇද ගන්නා ගින්න වළබ ගින්න යනුවෙන් හැඳින්වේ.

(25) "සන්තෝෂයෙන් පිනවමින් බුදුන් කරා දිව එකෙණෙහි ම හිරි ඔතප් ලද නියාවට කාරණ පැවා සේ..." යන පාඨයෙහි 'හිරිඔතප්' යන වචනයෙහි අදහස දෙන වරණය තෝරන්න.

(1) සෘද්ධි බලයෙන්
(2) විනාශ නොවූ
(3) හෙණ්ඩුවෙන්
(4) පවට ඇති ලැජ්ජාව හා බය

(26) ගාත්‍රාක්ෂර ලෝප සන්ධියට සුදුසු උදාහරණයක් නොවන වරණය තෝරන්න.

(1) කොග්ගල (2) කොළොම්තොට (3) මංමුළා (4) නෙළුම් මල්

(27) නිවැරදිව විසන්ධි වී ඇති පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) මිනිසා + ආගේ , දුක් + පත්
(2) ජීවන + ඕපාය , සුර + අත
(3) වි + අවුල , නිර්මාණ + අක්
(4) ජාති + ආලය , අන්ව + අර්ථ

(28) තමාගේ ම අත්දැකීමක් ඇසුරෙන් නිර්මාණය කළ "දූන්න දූනු ගමුවේ" වේදිකා නාට්‍යයේ රචකයා වන්නේ,

(1) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා
(2) දයානන්ද ගුණවර්ධන මහතා
(3) සුගතපාල ද සිල්වා මහතා
(4) සෝමලතා සුබසිංහ මහත්මිය

❖ අංක 29 සිට 30 තෙක් ප්‍රශ්නවල එක් එක් ප්‍රකාශනයේ අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

(29) "ගඟෙන් දිය බී මුහුදට ආවැඩීම"

(1) ගඟෙහි හා මුහුදෙහි වතුර බීමට නොහැකි බව
(2) තමාට උපකාර කළ තැනැත්තා සිරියදී වෙන කෙනෙකුට පැසසීම
(3) ගඟෙහි වතුර මුහුද වතුරට වඩා ප්‍රයෝජනයක් ඇති බව
(4) සියලු ම ගංගා ජලය මුහුදට ගලා යන බව

(30) "තෝං ලණුව දැමීම"

(1) හරකුන් මෙල්ල කිරීමට ලණුවක් යොදන බව
(2) අශ්වයාගේ නාසය විද ලණුවක් දැමීමෙන් මෙල්ල කරගත හැකි බව
(3) මෙම ලණුව සකස් කරගන්නේ "තෝං" නැමැති නූල් වර්ගයකිනි.
(4) සිතු පරිදි කටයුතු කරගැනීමට යොදාගත හැකිවීම

(31) පහත සඳහන් අක්ෂර ගැළපීමෙන් සූචනය වන සුපතළ පුද්ගල නාමයක් නිවැරදිව ඇතුළත් වරණය තෝරන්න.

(1) ල පා ගු සේ ල ර ක ණ ල ර ම
(2) න වි ර න පතා ණ ර සෙ ත්
(3) පා රි න ගා ධ ක ම අ ල ර් ම
(4) නා ක එ ස් ය සේ ධී නා ය ක



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

673

(32) A. ධරණීතලයේ සියලු ම සත්ත්වයින්ගේ සුමිතුරා ගස් ය. එහි වටිනාකම මිනිසා නොදනී.

B. මිනිසා වනාන්තර විනාශ කරයි. ස්වාභාවික විපත් ඇතිවේ.

C. ශාක රෝපණයට කටයතු සම්පාදනය සිදුවේ. මිනිසුන් ඊට අනුකූලතාවයක් නැත.

D. නොබෝ කලෙකින් වන සම්පත ධරණී තලයෙන් අතුරුදහන් වේ. මිනිසා වතුර බිංදුවට යුද්ධ ප්‍රකාශ කරන යුගය වැඩි ඈතක නොවේ.

ඉහත වාක්‍ය අතර සම්බන්ධතාවයක් ගොඩනැගීමට වඩාත් යෝග්‍ය නිපාත පද අනුපිළිවෙළ සහිත වරණය තෝරන්න.

(E - නිසා F - එවිට G - වුවද H - නමුත්)

(1) HEFG (2) GHEF (3) GEHF (4) FHGE

(33) පහත "අ" කොටසේ දක්වෙන වචනවල අර්ථය "ආ" කොටස සමඟ අනුපිළිවෙළින් නිවැරදිව ගැළපෙන වරණය තෝරන්න.

| අ | ආ |
|---|---|
| A. යාළුණු | E. ශක්‍රයා |
| B. සහසැස් | F. සත්‍යයෙන් |
| C. ශෘංගී | G. යහළු |
| D. සසින් | H. වස |

(1) GEHF (2) FGHE (3) GHEF (4) HFEG

(34) පහත දී ඇති කවියේ හිස්තැන පිරවීම සඳහා සුදුසු කවි පදය සහිත වරණය තෝරන්න.

පෙර කල් ජාතියෙ පැතුවා වැන්නේ
පරමල් පිදුවා දෝ පල දුන්නේ
..............................................................
හැම කල් මළ දා දෝ සැප වන්නේ

(1) වාල් විඳින දුක මෙනුඹ විඳින්නේ
(2) තරමුල් ඇඟ ඇට කිඹුලෙකු වැන්නේ
(3) මහල්ල නුඹගේ හිමිද අසන්නේ
(4) වාල් තමාවත් ඇත් ද ඉතින්නේ

(35) මැටි කාර්මිකයාගේ විවාහයේ දී මනාලියගේ දෙමාපියන් විසින් මනාලයාට දෙන දායාද අතර ප්‍රධාන වන්නේ,

(1) මැටි කෝවක් (2) සකපෝරුවක් (3) කුම්භයක් (4) ධාන්‍ය වර්ග

අංක 36, 37, 38 යන ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය සහිත වරණය තෝරන්න.

(36) (1) දරුවන් දෙමාපියන්ට කීකරු විය යුතු ය.
(2) සියලු ශිෂ්‍යයෝ සත්‍යගරුක විය යුතු ය.
(3) අප සියල්ලන් ම සැදහැත්තන් වෙමු.
(4) මා බොහෝ නාට්‍ය නරඹා ඇත්තෙමි.

(37) (1) සියලු සිසුහු පාසලේ විනය නීති අනුගමනය කළ යුත්තේ ය.
(2) සුජාතා තොමෝ කිරිපිඬු දන් රැගෙන ගියහ.
(3) ආනන්ද කුමාරස්වාමි මහතා ලක් මවගේ අභිමානවත් පුත්‍රයකු විය.
(4) ජෝර්ජ් කීට් විදග්ධ චිත්‍ර ශිල්පියෙක් වෙයි.

(38) (1) ඔහු විසින් මම රකිනු ලැබෙමි.
(2) ගොවියෝ විසින් ගවයන් බඳිනු ලබති.
(3) සතුරන් විසින් අපි පීඩාවට පත් කෙරේ.
(4) ළමයින් විසින් නාට්‍ය රඟපානු ලැබූහ.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

(39) පහත දැක්වෙන වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැරවූ විට වඩාත් නිවැරදි වරණය තෝරන්න.

"පාසල් අධ්‍යාපනය තුළින් සිසු පරපුරේ ආකල්ප හා සමාජ සාරධර්ම සංවර්ධනය විය යුතු බව අධ්‍යාපන ඇමතිතුමා විදුහල්පතිවරුන්ට කිව්වා."

(1) පාසල් අධ්‍යාපනය තුළින් සිසු පරපුරේ ආකල්ප හා සමාජ සාරධර්ම සංවර්ධනය විය යුතු බව අධ්‍යාපන ඇමතිතුමා විසින් කියයි.

(2) පාසල් අධ්‍යාපනය තුළින් සිසු පරපුරේ ආකල්ප හා සමාජ සාරධර්ම සංවර්ධනය විය යුතු බව අධ්‍යාපන ඇමතිතුමා විදුහල්පතිවරුන්ට ප්‍රකාශ කළේ ය.

(3) පාසල් අධ්‍යාපනය තුළින් සිසු පරපුරේ ආකල්ප හා සමාජ සාරධර්ම සංවර්ධනය විය යුතු බව අධ්‍යාපන ඇමතිතුමා කියන ලදි.

(4) පාසල් අධ්‍යාපනය තුළින් සිසු පරපුරේ ආකල්ප හා සමාජ සාරධර්ම සංවර්ධනය විය යුතු බව අධ්‍යාපන ඇමතිතුමාගෙන් කියවිණි.

(40) දී ඇති අදහසට වඩාත් සමීප අර්ථය දෙන වරණය තෝරන්න.

"කාව්‍යයක වටිනාකම රඳා පවතින්නේ කාව්‍ය වස්තුව මත නොව කවියාගේ පරිකල්පනය මතයි."

(1) කාව්‍යයක වටිනාකම කවියාගේ පරිකල්පනය මත පවතී

(2) කවියාගේ පරිකල්පනයත් කාව්‍ය වස්තුවත් මත වටිනාකමක් කවියට ඇත.

(3) පරිකල්පනය මත මිස කාව්‍ය වස්තුව මත කාව්‍යයක වටිනාකම රඳා නොපවතී

(4) පරිකල්පනයත් කාව්‍ය වස්තුව මතත් කාව්‍යයක වටිනාකම රඳා නොපවතී.

agaram.lk



agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 10 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - I, II

නම/විභාග අංකය :- ..........................................................

## සිංහල භාෂාව හා සාහිත්‍යය - II

◆ ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

(01) අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නො ලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) සිංහල අක්ෂර මාලාවෙහි දීර්ඝ ස්වර දෙකක් ලියන්න.

(ආ) "විසර්ගය" සහිත වචන දෙකක් ලියන්න.

(ii) (අ) "උදව් පදව්" යනු යුගල පදයකි. එහි පළමු පදය අර්ථ සහිත ය. දෙවන පදය අර්ථ රහිත ය. එවැනි වෙනත් යුගල පදයක් ලියන්න.

(ආ) පහත සඳහන් වාක්‍ය අතීත කාල බහුවචනයට හරවා ලියන්න.

"මම විහාර මහා දේවියගේ කතා පුවත කියවමි."

(iii) (අ) "නුසුදුසු කෙනෙකුට වගකීම් පවරා දීම" යන අදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ වන්නේ "නරියාට කුකුළු කොටුව භාර දුන්නා" යන්නයි. කරදරයකින් තවත් කරදරයකට පත්වීම" යන අහදහසට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

(ආ) "නිෂ්ඵල උත්සාහයක යෙදීම" යන්නෙන් අදහස් කරන්නේ, "අඟින් කිරි දෙවීම" යන අදහසයි. "අවිශ්වාසයෙන් යමක් කිරීම" යන අදහසට සුදුසු සාම්ප්‍රදායික යෙදුම ලියන්න.

(iv) පහත සඳහන් වාක්‍යයේ පද දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වාක්‍ය දෙක පමණක් නිදොස් කර ලියන්න.

"අනුරාධපුරයේ ඇතැම් දාගැබ්වල මලුවට ඇතුළු වන දොරටුවෙහි පියගැට පෙළ අසල කොරහක හැඩයට වල ගැසුණු ගල් කුට්ටි තිබුණේ ය."

(v) පහත සඳහන් කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(අ) විදුහල්පතිතුමා පාසල් සංවර්ධන සමිතියේ දෙමාපියන් ඇමතුවේ ය.

(ආ) සිසුහු පාසල් විනය නීති සුරකිති.

(vi) පහත සඳහන් කවිපදවල ඉරි ඇඳි පද අයත් ව්‍යාකරණ වර්ගය ලියන්න.

පෙර විරුවන් ඔබගේ පුතේ
ඉදි කළ වැව් <u>බලන්</u> පුතේ
දැනේ සවියෙනුයි පුතේ
ඒ <u>මහ</u> වැව් බැඳුණේ පුතේ

(අ) බලන් (ආ) මහ

(vii) පහත දක්වෙන නාමපදවල නාම ප්‍රකෘතිය ලියන්න.

(අ) ගිරවුන් (ආ) මිනිස්සු

(viii) පහත සඳහන් පද විසන්ධි කර එය කුමන සන්ධි වර්ගයකට අයත් දැයි ඉදිරියෙන් ලියන්න.

(අ) පිනැති (ආ) පිළිතුරු



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(ix) පහත සඳහන් පදවල තේරුම ලියන්න.
   (අ) අධිවාසනා
   (ආ) සබවස

(x) පහත සඳහන් පරිමිත භාෂා ව්‍යවහාර පොදු ව්‍යවහාරයෙන් ලියන්න.
   (අ) උබර
   (ආ) මුත්තෙට්ටුව

(ලකුණු 2 × 10 = 20)

(02) පහත දැක්වෙන (අ) , (ආ), (ඉ), (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නො අඩු වන සේ රචනයක් ලියන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(අ) පවුල් සංස්ථාව තුළ හැදෙන වැඩෙන දරුවන්ගේ ආරක්ෂාව දැනුම හා දියුණුව සැලසීම උදෙසා දිවා රෑ ඇප කැප වී වෙහෙසෙන්නෝ අපේ වැඩිහිටියෝ ය. වයස්ගත වූ පසු ත... නිවෙස්වල ම රඳවා ගනිමින් ඇප උපස්ථාන කරමින් ඔවුන් රැක ගැනීම දරුවන්ගේ වගකීමකි. වර්තමානයේ බිහිවන වැඩිහිටි නිවාස නිසා ඉහත කියන ලද උත්තරීතර වගකීම සමාජයෙන් ගිලිහී යන සෙයක් දක්නට ලැබේ. මේ තත්ත්වය මඟ හරවා නිවෙස්වල දී ම ආදරයෙන් වැඩිහිටියන් රැක බලා ගැනීම සමාජයේ වගකීමකි.

(ආ) අතීතයේ මිනිසුන් බෝවන රෝගවලින් පීඩා විඳි නමුත් වර්තමාන සමාජයේ ඇති ප්‍රබල ම ගැටලුව වයස් භේදයකින් තොරව බෝ නොවන රෝගවලින් පීඩාවට පත් වීමයි. මෙයට ප්‍රධානම හේතු පරිසර දූෂණය, කෘෂි රසායන ද්‍රව්‍ය භාවිතය හා අවිධිමත් ආහාර රටාවන්ට පුරුදු වීමයි. ආහාර හා සෞඛ්‍ය ගැන සැලකිලිමත් වීම සුවදායී ජීවිතයකට මග පාදයි.

(ඉ) සංවර්ධනය වන රටක සංවර්ධනයේ වැදගත් සාධකයකි. ගමනාගමනය, වර්තමානයේ අපේ රටේ පවත්නා පොදු ගමනාගමන ක්‍රම ගැන විවිධ චෝදනා හා යෝජනා නිතර අසන්නට ලැබේ. මහජනයාගේ පහසුව සඳහා පොදු ප්‍රවාහන සේවයක් මඟින් රටේ සංසරණය වන පෞද්ගලික වාහන ප්‍රමාණය අවම කර ගත හැකි ය. එමඟින් පරිසර දූෂණය අවම වන අතර මාර්ග තදබදයට ද විසඳුමකි. විශේෂයෙන් සංවර්ධනය වූ පොදු දුම්රිය සේවයක් ආරම්භ කිරීම සැලකිල්ලට ගත යුතු කරුණකි.

(ඊ) ස්වභාව ධර්මයත් මිනිසාත් අතර පවතින්නේ දැඩි සම්බන්ධතාවයකි. මෙකී සම්බන්ධතාව මනා ලෙස පවත්වා ගැනීමේ දී ස්වභාව ධර්මය විසින් ලබා දෙනු ලබන සම්පත් සංරක්ෂණය කර ගැනීමට අවශ්‍ය වන්නේ ය. වර්තමානයේ දී මේ කාර්ය සඳහා බාධාකාරී ලෙස බලපාන හේතු සාධක අතිශය ඛේදජනක වේ. ස්වභාව ධර්මය සුරක්ෂිත කර ගැනීමේ භාරදූර වගකීම සමස්ත සමාජයට ම භාර වන්නේ ය.

(ලකුණු 25)

(03) පහත දැක්වෙන ඡේදය වචන 40 - 45 අතර වන සේ සාරාශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

අද අපට ප්‍රධාන වශයෙන් ම වුවමනා කර ඇත්තේ සාමයයි. මීට ඉහත වකවානුවල දී මෙවැනි ප්‍රශ්න විසඳන ලද්දේ යුද්ධ මාර්ගයෙනි. එය මුළු මානව සංහතිය ම විනාශ කර දැමීමේ මාර්ගයෙක් නොවී ය. අද අපට යුද්ධ කිරීමෙන් වැඩක් නැත. කවර හෙයින් ද? යුද්ධයෙකින් සමස්ත මනුෂ්‍ය සංහතිය ම විනාශ වන හෙයිනි. මේ ජය ගත්තෝ ය. මේ පරාජයට පත් වූවෝ ය යනුවෙන් විශේෂයක් කරන්නට ඉඩ නැත. වෙන්නේ සියල්ලන් හට ම එක විට ම මැරෙන්නට ය. ඒ නිසා මේ වකවානුවේ දී අපට අත්‍යවශ්‍ය වනුයේ සාමයයි. සාමය කියන්නේ නැති දෙයකට නොවේ. යුද්ධය නැති තැන සාමය තිබේ යැයි කීම වැරදි ය. වචනාර්ථයෙන් මෙන් ම යථාර්ථයෙන් ද අප සාමය අත් කරගත යුතු ය. එය අත්කර ගන්නේ කෙසේ ද? එය අත්කර ගත හැකි මාර්ගය කිමෙක් ද? ලෝක සාමය අත් කර ගත හැකි මාර්ගය එක්සත් ජාතීන්ගේ කතිකාවතෙහි මොනවට පෙන්වා දී ඇත්තේ ය. ඒ අනුව අප කළ යුත්තේ අපේ අවුල් වියවුල් සාමයෙන් හා සාකච්ඡාවෙන් බේරුම් කර ගැනීම ය..

(ලකුණු 10)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(04) පහත දැක්වෙන පද්‍ය පන්තිය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

දෙස රැස බස බසවනුවට මුළු දිවිය ම විය කැරවිණි
හෙළ තෙරුවන පණ ගන්වන උතුරු මිනිස් ගුණ ඇගයිණි
රටට දැයට සෙත සලසන නව ගමනක මං ඉදිවිණි
හැබෑ මිනිස් ගුණ නොතකන දුහුවනගේ වැඩ නොතැකිණි

බස් විදුහුරුකම් රැක දෙන හොඳ බස් මග පෙරට යැවිණි
රැහැට වැරදූ රදළ සෙනඟ සමඟ සදා සටන් වැදුණි
හෙළය ඉහළ යවන පැතුම් හදවත් තුළ ජනිත කැරිණි
රට පහතට හෙළන අයට හොඳ හැටියට දෙස්ස කැපුණි

(i) කවියට අනුව මුළු ජීවිතය ම කැපකර ඇත්තේ කුමක් වෙනුවෙන් ද?

(ii) කවියට අනුව මිනිස් හදවත් තුළ ජනිත කළේ කුමක් ද?

(iii) දුහුවන්ගේ ගති ලක්ෂණය කුමක් ද?

(iv) මෙහි සඳහන් රුඩීය ලියන්න.

(v) පහත සඳහන් පදවල තේරුම ලියන්න.

(i) හෙළ (ii) රැහැට

(ලකුණු 2 × 5 = 10)

(05) ජනප්‍රිය නාගරික පාසලක් වූ ඔබේ පාසල තුළ ජාතික සංහිඳියාව ගොඩනැගීමේ ක්‍රමවත් සැලැස්මක් ඇතැයි සිතන්න. අඩු පහසුකම් සහිත උතුරු නැගෙනහිර පළාතේ දුෂ්කර පාසලක දුප්පත් දරුවන් වෙනුවෙන් අවශ්‍ය පාසල් උපකරණ, ඇඳුම් පැළඳුම්, ආහාර පාන, සෞඛ්‍ය සේවා ආදිය සැපයීමේ අරමුණින් එම පාසලට නැගම් යාමට තීන්දු කර ඇතැයි සිතා, එම පාසලේ විදුහල්පතිතුමා දැනුම්වත් කිරීමට ලිපියක් ලියන්න. (ඔබ පාසල් සංහිඳියා සංගමයේ ලේකම් යැයි සිතන්න.)

නැතහොත්,

ඔබ ගමේ පිහිටුවා ඇති ප්‍රජා සෞඛ්‍ය සංවිධානය ගම්වාසීන්ගේ සෞඛ්‍ය පුරුදු හා අපද්‍රව්‍ය පරිසරයට බැහැර කිරීම ක්‍රමවත්ව සිදු කිරීම සඳහා වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරයි. එහි පළමු වන පියවර වශයෙන් බෝ නොවන රෝගවලින් ජනතාව බේරා ගැනීම සඳහා සුදුසු වැඩසටහනක් පැවැත්වීමට අදහස් කර ඇත. එයට සහභාගී වීමට ගම්වාසීන් දැනුම්වත් කිරීමට සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න.

(ලකුණු 15)

(ලකුණු 10)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 10 - ශ්‍රේණිය

## සිංහල භාෂාව හා සාහිත්‍යය - III

නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 02 යි.

සැලකිය යුතුයි:

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු ලියන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.

---

- (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(01) (i) (අ) ටිබෙට් ජාතික එස්.මහින්ද හිමියන් විසින් රචිත ඔබට නියමිත පද්‍ය පන්තිය කුමක් ද?

(ආ) එය උපුටා ගත් දීර්ඝ කාව්‍ය පන්තිය නම් කරන්න.

(ii) (අ) බැද්දේගම සිංහලයට පරිවර්තනය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(ආ) වනගත පරිසරය පසුබිම් කොටගෙන සිංහලයට නැගූ කෘතියක් සඳහන් කරන්න.

(iii) "කොල බ්‍රහ්මදත්ත රජු එක් සියයක් රජුන් හා සේනාව හා ඇරගෙන පලා යත්නාහ."

(අා) ඉහත පාඨය ඇතුළත් ග්‍රන්ථය ලියැවුණේ කුමන සාහිත්‍ය යුගයේ ද?

(ආ) ඉහත ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(iv) නවතා ගිගිරියේ
අසන ලෙස සිත් පිරියේ
කැර කත් බිහිරියේ

(අ) මෙහි ඉතිරි පද්‍ය පාදය ලියන්න.

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදයේ අර්ථය ලියන්න.

(v) (අ) සිංහබාහු නාට්‍යය කාගේ නිර්මාණයක් ද?

(ආ) එම නිර්මාණකරුවා විසින් රචිත ස්වයං ලිඛිත චරිතාපදානය කුමක් ද?

(vi) (අ) එච්.එම්.කුඩලිගම කවියා කුමන සාහිත්‍ය යුගයට අයත් කවියෙක් ද?

(ආ) ස්වභාව සෞන්දර්යය හා බැඳුණු කවි ආර හේතුවෙන් ඔහු ප්‍රකට වූයේ කුමන නමකින් ද?

(vii) (අ) උපදේශාත්මක ජනකවි ඇතුළත් ඔබට නියමිත පාඩම කුමක් ද?

(ආ) විවේකය, දූනුවත්කමින් හා විනෝදයෙන් ගත කිරීම සඳහා භාවිත වන කවි වර්ගය කුමක් ද?

(viii)(අ) ජාතක කතා පොත රචනා වූයේ කවරකුගේ අනුග්‍රහයෙන් ද?

(ආ) ජාතක කථා අතර දීර්ඝතම ජාතක කථාව කුමක් ද?

(ix) "පින් තකා ඇයට දූන් කුරක්කන් අහුරු කීපයකට ඇ බොහෝ වෙහෙස වී වැඩ කළ යුතු වූවා ය.

(අ) ඉහත උද්ධෘතය උපුටාගත් කෘතිය නම් කරන්න.

(ආ) මෙහි "ඇ" යනුවෙන් සඳහන් වන්නේ කවුරුන් පිළිබඳව ද?

(x) (අ) තමා අකෘතඥයකු නොවන බව ගුරුවරයාට ඇඟවීම පිණිස ලියැවුණු ජාතක කාව්‍යය කුමක් ද?

(ආ) මෙහි සඳහන් ගුරුවරයා නම් කරන්න. (ලකුණු 2 x 10 = 20යි)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(02) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) "ඉතා ම බඩ සා සැටි ය. කැමැත්තෙහි වී නම් කිලින් පොදියක් කොට බැඳගෙන ගොස් පැහැර පියා පිසගෙන බඩ පුරා කා නො මිය."

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) මෙම ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(ii) තත මතු ද සින්දේ
පිළිමල් දප ද සින්දේ
යස දිගත ඇන්දේ
විජය සිරි සඟ ගෙන වැලැන්දේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවවල අර්ථය ලියන්න.

(ආ) සමස්ත කවියේ අර්ථය ලිහිල් බසින් ලියන්න.

(iii) "ලෙඩට බේත් කොච්චර තිබුණත් කරුමෙට බේත් තියෙනවා යැ."

(අ) ඉහත ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් කා හට ද?

(ආ) මේ පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iv) සේ රිවි බිම්බා පතළ තෙද බලැති මහරු
මෙන රන් වැම්බා නිසසල ගුණයෙන් සපිරු
මනරම් යුග බා දී අහස ඔසවන අයුරු
නෙ විකුම් සිහ බා පෙරළුවේ ය ගල් පුවරු

(අ) ඉහත පද්‍යයෙන් උපමාවක් උපුටා ලියන්න.

(ආ) අවසන් කවි පද දෙකෙහි අර්ථය ලිහිල් බසින් ලියන්න.

(v) "කනක රජතාදීන් විචිත්‍ර වූ රක්ත නීලා දී නා නා වස්ත්‍රයෙන් සමුජ්වලිත රථාදියෙහි නඟන නා නා ප්‍රකාර ධවලඡත්‍ර පන්තියෙන් ගැවසී ගත්තී ය."

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.

(ආ) ඉහත උද්ධෘතයෙන් විස්තර කෙරෙන්නේ කුමක් පිළිබඳව දැ යි පහදන්න. (ලකුණු 04×05 =20යි)

(03) (i) (අ) නැන්චොහාමි කී අනාවැකිය අනුව බැද්දේගම පරිහානිය කරා යාමත්

(ආ) බැද්දේගම වැසියන් මුහුණ පාන විවිධ දුක් පීඩාත්

බැද්දේගම නිර්දිෂ්ට කොටසින් නිරූපණය කෙරේ. එකිනෙකට සුදුසු නිදසුන් දෙක බැගින් දක්වමින් සාකච්ඡා කරන්න.

නැතහොත්

(ii) (අ) ගැමි සමාජයෙන් උකහා ගත් සාම්ප්‍රදායික යෙදුම් ද

(ආ) ජන කවියා යොදාගත් කාව්‍යාලංකාර ද

නිසා "හානා හීය පානා අඬහැරෙන් දනේ" පැදිපෙළ රසවත්වීමට බෙහෙවින් ඉවහල් වී ඇත. උචිත නිදසුන් දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(04) (i) (අ) අවස්ථාවට ගැළපෙන පරිදි උපමා භාවිතයත්

(ආ) චරිත නිරූපණය තුළින් විවිධ රස ජනනය කිරීමත්

සතර කන් මන්ත්‍රණය රසවත්වීමට බලපා ඇති ආකාරය එකිනෙකට සුදුසු නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

(ii) (අ) අවස්ථා හා සිද්ධි නිරූපණයේ දී පෑ විශිෂ්ටතාවත්

(ආ) කවියා යොදාගත් බස්වහරක්

වෙණ මිහිර රසවත් සාහිත්‍යාංගයක් වීමට උපයෝගී වූ ආකාරය එකිනෙකට නිදසුන් දෙක බැගින් දක්වමින් සාකච්ඡා කරන්න.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

www.agaram.lk

**5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු ලියන්න.**

(05) ගංගාවක ගමන් විලාසය සංකල්ප රූප මැවෙන අයුරින් සජීවීව ඉදිරිපත් කිරීම ගංගාවේ සංගීතය පැදිපෙළේ සුවිශේෂීතාවයි. සුදුසු නිදසුන් තුනක් ඇසුරින් විමසන්න. (ලකුණු 10යි)

(06) නාට්‍යෝචිත අවස්ථා බහුල වීම සිංහබාහු නාට්‍යය බෙහෙවින් ප්‍රේක්ෂක ප්‍රසාදය දිනා ගැනීමට ඉවහල් වී ඇත. නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(07) කාලීන අවශ්‍යතාවක් දරුවන්ගේ සිත්සතන් තුළට කාවදින අයුරින් පැවසීම මුනි සිරිපා සිඹිමින්නේ පැදි පෙළේ අරමුණයි. සුදුසු නිදසුන් තුනක් ඇසුරින් සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk



agaram.lk